# පාරිභෝගික උපදෙස්

ලියාපදිංචි ආගමන ඒජන්තවරුන් යනු ප්‍රමිතීන් සපුරාලන, ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරන්නා වූ සංක්‍රමණ නීති සහ පටිපාටීන් පිළිබඳ යාවත්කාලීන දැනුමක් පවත්වා ගන්නා නිපුනතාවයෙන් හෙබි අය වෙති.

ඔබේ ආගමන ඒජන්තවරයා සංක්‍රමණ සහය ලබාදීමට සුදුසු පුද්ගලයන් පමණක් ලියාපදිංචි කිරීම සහතික කරන OMARA (Office of the Migration Agents Registration Authority), හි ලියාපදිංචිය ලබා ඇති අයකු වීම අනිවාර්ය වේ. යම් පුද්ගලයකු ලියාපදිංචි වී ඇති බව පිරික්සනු වස්, OMARA හි වෙබ් අඩවය වන: www.mara.gov.au වෙත පිවිසෙන්න.

## ආගමන ඒජන්තවරු සහ ආචාර ධර්ම පද්ධතිය

ආචාර ධර්ම පද්ධතිය, ඔබේ ආගමන ඒජන්තවරයා:

- වීසා බලපත්‍රයක් ලබාගැනීම පිළිබඳ ඔබට ඇති හැකියාව පිළිබඳව ඔබ හා අවංක විය යුතු ;
- ඔබේ අයදුම්පතේ ප්‍රගතිය පිළිබඳව සහ එයට ඇති විය හැකි බලපෑම් පිලිබඳව නිතර ඔබ දැනුවත් කල යුතු ;
- කාර්යාල වේලාවන් තුලදී ඇමතිය හැකි විය යුතු අතර ඔවුන්ගේ ඇමතුම් තොරතුරු වෙනස් වේනම් ඒ පිළිබඳව ඔබ දැනුවත් කල යුතු ;
- නීතිය තුල ක්‍රියා කලයුතු අතර, ඔබේ අවශ්‍යතාවයන්ට අනුකුල විය යුතු සහ ඔබේ පුද්ගලිකත්වය ආරක්ෂා කල යුතු ;
- ඔබේ අයදුම්පත කෙරෙහි බලපෑ හැකි ඔවුන් තුල පුද්ගලික අභිමතාර්ථයන් ඇත්නම් ඒවා ප්‍රකාශ කළ යුතු අතර ප්‍රතිවිරුද්ධතා ඇති නම් ඔබ වෙනුවෙන් කටයුතු නොකල යුතු ;
- ඔබ වෙත සපයනු ලබන සේවාවන්, ගාස්තු සහ අනෙකුත් වියදම් පිළිබඳව-කටයුතු ඇරඹීමට පෙර-ලිඛිත වාර්තාවක් ඔබ වෙත ලබාදිය යුතු ;
- සාධාරණ ගාස්තුවක් අයකිරීම සහ ඔබ ආරම්භයේදීම ගාස්තු ගෙවන්නේ නම් ඒවා වෙනම බැංකු ගිණුමක තැන්පත් කිරීම කල යුතු ;
- ඉටුකරන ලද සැබෑ සේවාවන් ලැයිස්තුගත කලයුතු සහ ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව සඳහන් ලදුපතක් ඉදිරිපත් කල යුතු;
- කාලීනව සහ නිවැරදිව උපදෙස් සැපයීම සහ ඔබේ අයදුම්පතෙහි ප්‍රතිඵලය හැකි විගස ලිඛිතව දැනුම් දීම කල යුතු බවට සහතික වේ.

## පැමිණිලි

ඔබේ ලියාපදිංචි ආගමන ඒජන්තවරයා සමග ගැටළු සහගත තත්වයක් අත්විදී නම් ඒවා ඔවුන් සමග නිරාකරණය කරගත යුතුය. උපකාර සඳහා OMARA හා සම්බන්ධ වන්න.

*OMARA වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම ඔබේ වීසා අයදුම්පත කෙරෙහි අනිසි බලපෑමක් ඇති නොකරයි.*

## Office of the Migration Agents Registration Authority (OMARA)

ඔස්ට්‍රේලියානු නීතිය අනුව, OMARA:

- ආගමන ඒජන්තවරයකු වීමට කරන ලද අයදුම ඇගැයීම සහ ඒවා තීරණය කරයි ;
- ඒජන්තවරුන් සඳහා වන අඛණ්ඩ වෘත්තීමය උන්නති ක්‍රියාකරකම් අනුමත කරයි ;
- ලියාපදිංචි ආගමන ඒජන්තවරයන්ගේ සදාචාරාත්මක බව නිරීක්ෂණය කරන ; සහ
- ආගමන ඒජන්තවරුන්ට එරෙහි පැමිණිලි විභාග කරනු ඇති අතර අවස්ථානුගතව ඔවුන් හික්මවනු ලබයි.

ඔබේ වීසා අයදුම්පත හෝ අනුග්‍රාහකත්වය සම්බන්ධයෙන් උපකාර කිරීමට හෝ ඔබේ ආගමන ඒජන්තවරයා හට ඔබට ගාස්තු නැවත ගෙවීම සඳහා විධානය කිරීමට OMARA හට හැකියාවක් නැත.

වැඩිදුර තොරතුරු : www.mara.gov.au වෙතින් සොයාගත හැක.

- ආචාර ධර්ම පද්ධතිය
- ලියාපදිංචි ආගමන ඒජන්තවරයෙකු වෙතින් සේවා ලබාගැනිමට අවශ්‍ය උපදේශ
- දළ ඒජන්ත ගාස්තු

### යමෙකු ලියාපදිංචි වී ඇත්ද යන්න www.mara.gov.au වෙතින් පිරික්සන්න.

